**යටියන්තොට ප්‍රාදේශීය සභාව**
**කෑගල්ල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කල මතය**
**---------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට යටියන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** සමාලෝචිත වර්ෂය තුල ඉදිරි වර්ෂය සඳහා ලද රු.230,626 ක වරිපනම් බදු, ආදායම් ණයගැති ගිණුමට බැර කිරීම නිසා 2017 දෙසැම්බර් 31 දිනට ආදායම් ණය ගැතියෝ හා කලින් ලද ආදායම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

**(ආ)** සේවකයන්ගෙන් අයකරගන්නා ලද සේවක අර්ථසාධක අරමුදල් රු. 31,512 ක්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් රු. 7,878 ක් හා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් දායකයන් රු.159,067 ක් වැය සංකේත වලට බැර කිරීම නිසා වර්ෂයේ අතිරික්තය රු. 198,457 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**(ඇ)** පසුගිය වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබුණු රු. 3,215,029 ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

**(ඈ)** කලින් ලද කඩකුලී රු.7,400 ක් සමුච්චිත අරමුදලට බැර කිරීම නිසා කලින් ලද ආදායම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඉ)** කසල බඳුන් 17 ක් විකිණීමෙන් ලැබී තිබුණු රු. 31,875 ක්, ප්‍රාග්ධන වියදම් වැය සංකේතයට බැර කිරීම නිසා ප්‍රාග්ධන වියදම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඊ)** විවිධ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ ප්‍රතිපාදන මත 2017 වර්ෂයේ නිමකරන ලද කර්මාන්ත 15 ක වටිනාකම රු. 6,706,234 ක් 2017 වර්ෂයේ ණයගැතියෝ හා ණයහිමියෝ ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු නොකර ප්‍රතිපාදන ලද වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

**(උ)** 2017 දෙසැම්බර් 31 දිනට සේවක ඇප තැන්පත් ආයෝජන රු. 75,700 ක් මූල්‍ය ප්‍රකාශන වල ආයෝජන ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 06 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.16,219,744 ක් වූ නමුත්, ඊට අදාළ උපයෝගී ලේඛන/වාර්තා අනුව එකතුව රු.9,305,189 ක් වූයෙන් වෙනස රු.6,914,555 විය.

(ආ) ස්ථාවර වත්කම්වල වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු. 13,320 ක වෙනසක් පැවතුණි.

**1.3.3 අවිනිශ්චිත ගිණුම්**

අවිනිශ්චිත ගිණුමේ වර්ෂ ගණනක සිට පැවති රු. 65,621 ක බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) **ලැබිය යුතු ගිණුම්**

2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 5,699,626 ක් විය.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 585,438 ක් විය.

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්.**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 67 හා 68 වගන්ති | - | 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සංවර්ධන බලපත්‍ර 148 ක් ලබාදී තිබුණද එයින් 13 ක් සඳහා පමණක් අනුකූලතා සහතික නිකුත් කර තිබුණි. |
| (ආ) | 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් මඟින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත | 48,000 | පරිසර බලපත්‍ර ලබා ගතයුතු ව්‍යාපාර ආයතන 12 ක් විසින් පරිසර බලපත්‍ර ලබා නොගැනීම මත ආදායම් අහිමි වී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,042,506 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,910,095 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල් කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,346,356 | 4,346,356 | 3,779,165 | 884,801 | 4,238,510 | 4,238,510 | 3,842,178 | 1,204,113 |
| (ii) | කුලී | 4,391,785 | 4,391,785 | 4,177,122 | 77,240 | 3,771,695 | 3,996,695 | 4,124,220 | 111,983 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 720,000 | 720,000 | 1,107,518 | - | 695,000 | 695,000 | 944,947 | - |
| (iv) | වෙනත් ආදායම් | 12,829,200 | 12,829,200 | 4,188,623 | 17,415,000 | 11,708,560 | 11,708,560 | 3,074,284 | 18,080,000 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, කුලී, බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගේ රැස්කළ ආදායම පිළිවෙලින් සියයට 87,95, 154 ක් හා 33 ක් විය.

### 2.2.3 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** යම් වරිපනම් බද්දක් හෝ අක්කර බද්දක් නොගෙවීම සම්බන්ධයෙන් වූ විට එම බද්ද අයවීමට ඇති ස්ථානයේ අයිතිකරුගේ දේපල තහනමට ගෙන විකිණීමෙන් හෝ මුදල් අයකර ගැනීමට කටයුතු කලයුතු වුවත් නියැදි පරීක්ෂණය අනුව ඉඩම් හිමියන් හා වරිපනම් / අක්කර බදු ස්ථාන 44 කින් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයනොවූ රු.113,851 ක් අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නොතිබුණි.

**(ආ)** 2010 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන 2012 වර්ෂයේ සිට වරිපනම් අය කර තිබුණු අතර යාවත්කාලීනව වරිපනම් තක්සේරු කර අයකර නොතිබුණි.

**2.2.4 බලපත්‍ර ගාස්තු**

**---------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** සභා බල ප්‍රදේශයේ බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු ගෙවිය යුතු ස්ථාන පිළිබඳව විධිමත් සමීක්ෂණයක් සිදුකර නොතිබූණු අතර ගාස්තු අයකිරීම් අනුව ආදායම් ලේඛන නඩත්තු කර තිබුණි.

**(ආ)** බලපත්‍ර ගාස්තු ලැබීම් ලේඛනය පිළිබඳ කරන ලද නියැදි පරීක්ෂාවට අනුව ආයතන 42 කින් රු. 32,900 ක ගාස්තු අය වී නොතිබුණි.

**(ඇ)** මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර බලපත්‍ර ලබාගෙන තිබුණු ව්‍යාපාර 04 ක් වෙළඳ බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

**2.2.5 කුලී**

**----**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් යටියන්තොට ප්‍රාදේශීය සභාව නව ප්‍රදේශීය සභාවක් ලෙස සංස්ථාපනය වී තිබුණද පොදු වෙළඳ සංකීර්ණයේ කඩ හිමියන් සමඟ නව ගිවිසුම්වලට එළඹ නොතිබුණි. 1986 වර්ෂය හා 1988 වර්ෂය අතර කාලපරිච්ඡේදය තුල කෑගල්ල සංවර්ධන සභාව නමින් බදු හිමියන් අතර ගිවිසුම්ගතවී තිබුණි. බදු ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සභාවට ලබාගත හැකිව තිබූ ආදායම අහිමි වී තිබුණි.

**(ආ)** යටියන්තොට බස්නැවතුම්පල පිහිටි කඩ කාමර 08 ක් බදුදීම සඳහා 2011 වර්ෂයේදී ගිවිසුම්ගතවී තිබුණි. ගිවිසුමේ වලංගු කාලය වර්ෂයකට සීමා වුවද ගිවිසුම්වල වලංගු කාලය ඉක්මවා වර්ෂ 05 ක් ගත වී තිබුණද නව ගිවිසුම් වලට එළඹීමට කටයුතු කර නොතිබුණි.

**2.2.6 වෙනත් ආදායම්**

**-----------------**

**ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු**

**------------------------------**

සභා බල ප්‍රදේශය තුල සවිකර තිබුණු ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර දැන්වීම් පුවරු 03 ක් වෙනුවෙන් ලැබිය යුතු ගාස්තුව රු.37,200 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**---------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවියයුතුව තිබුණු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 9,832,683 ක් හා රු.4,699,711 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 කාර්යසාධනය**

**---------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

**-------------------**

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 12 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වනවිට කාරණා 06 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

**(ආ) ක්‍රියාත්මක නොකළ කර්තව්‍යයන්**

**---------------------------------**

සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ප්‍රාදේශීය සංවර්ධන සැලැස්ම 2016 යටතේ ඉටුකළ යුතු වටිනාකම රු. 300,859 ක් වූ කර්මාන්ත 02 ක් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් ආරම්භ කර නොතිබුණි.

**(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

**--------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(i)** කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමෙන් පසු ඉතිරි වන ප්ලාස්ටික් හා පොලිතීන් වැනි නොදිරණ අපද්‍රව්‍ය ව්‍යාපෘති භූමියෙහි ගොඩගසා තිබුණු අතර ඒ සඳහා ප්‍රතිචක්‍රීයකරණ ක්‍රමවේද ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ii)** පැති බැම්මක් නොමැති බැවින් පරිශ්‍රයෙන් බැහැර ඉඩම් වලට කසළ ගලා යාමෙන් පාරිසරික ගැටළු මතුවීමේ අවදානමක් තිබුණි.

**(iii)** ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ස්ථිර ජල සැපයුමක් නොතිබුණු අතර බවුසර් මඟින් ජලය සැපයීම හේතුවෙන් පොහොර නිෂ්පාදන කටයුතු හා සේවකයන්ගේ ජල අවශ්‍යතා සපුරා ගැනීමේදී ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වී තිබුණි.

**(iv)** ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ගොඩගසා තිබුණු අතර අපහරණයට කටයුතු කර නොතිබුණි.

**(ඈ) පාරිසරික ගැටළු**

**-------------------**

සභාව විසින් 2016 ජූලි මාසයෙන් පසුව ගලි සේවාව ලබා දී නොතිබුණු අතර ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ඉල්ලුම්කරු සතුව පෞද්ගලික ස්ථානයක් තිබේ නම් පමණක් මෙම සේවාව ලබා දී තිබුණි. යටියන්තොට නාගරික වරිපනම් සීමාව තුල වරිපනම් හිමියන් 2,028 ක් සිටින අතර ගලි සේවාව සැපයීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

**(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක**

**-------------------------**

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි මාසය වන විටත් සකස් කර නොතිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරු ලබා ගිය, මියගිය හා සේවය හැර ගිය පුද්ගලයින් 41 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 05 කට වඩා පැරණි සේවක ණය රු.175,155 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

------------------------------

**3.3.1 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

වටිනාකම රු. 3,390,540 ක් වූ වාහන 05 ක් හා උපාංග 01 ක් වර්ෂ 03 සිට වර්ෂ 08 දක්වා කාලපරිච්ඡේදය තුළ නිෂ්ක්‍රීයව පැවතිණි.

**3.3.2 පවරා නොගත් වත්කම්**

----------------------------

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මඟින් ලබා දෙන ලද වටිනාකම රු. 36,672,420 ක් වූ වාහන 05 ක හා සබරගමුව පළාත් සභාව මඟින් ලබා දෙන ලද වාහන 05 ක අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 ප්‍රසම්පාදනය**

---------------

**3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

----------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් වැය විෂයන් 40 ක එකතුව රු. 2,461,084 ක ප්‍රතිපාදන සියයට 100 ක් හා වැය විෂයන් 22 ක ප්‍රතිපාදන එකතුව රු. 2,531,552 කින් සියයට 50 ක් ලෙස එකතුව රු. 4,992,636 ක ප්‍රතිපාදන සභා කටයුතු සඳහා උපයෝජනය කර නොතිබුණි.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

--------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | අවිනිශ්චිත ගිණුම නිරවුල් නොකිරීම |
| | | (ii) | කල් ඉකුත් තැන්පත් ආදායමට නොගැනීම |
| | | (iii) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම |
| | | (iv) | ජර්නල් සටහන් සඳහා පැහැදිලි සංලක්ෂ ඉදිරිපත් නොකිරීම |

| | | | |
|---|---|---|---|
| | | (v) | ආදායම් , වියදම් හා වත්කම්, බැරකම් අඩුවෙන් හා වැඩියෙන් ගිණුම්ගත කිරීම |
| | | (vi) | ලෙජර් ගිණුම් ශේෂ හා ලේඛන නොසැසඳීම |
| (ආ) | අයවැය පාලනය | | වැය සංකේත සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් ඉතිරි කර තිබීම |
| (ඇ) | ආදායම් පරිපාලනය | | බදුකුලී නිසි කලට තක්සේරු කර නොගැනීම |
| (ඈ) | වාහන පාලනය | (i) | දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම |
| | | (ii) | වාහන ලොග් පොත් යාවත්කාලීන නොකිරීම |
| | | (iii) | ගර්හිත හා අළුත්වැඩියා කළයුතු වාහන සම්බන්ධයෙන් කටයුතු නොකිරීම |